**18-09-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ පාරිශුද්ධකරු පියාගේ ශ්‍රීමත් අනුගමනය කිරීමෙන්, පිවිතුරු වන අතර ඔබට පිවිතුරු ලෝකයේ උරුමය හිමි වන්නේ මෙලෙසිනි. තමන්ගේ මත පිළිපැදීමෙන් පිවිතුරු වන අයට, කිසිවක් නොලැබෙයි.

**ප්‍රශ්නය:** සේවය කිරීමේදී, ඔය දරුවන් විශේෂ අවධානයක් යොමු කළ යුත්තේ කුමකටද?

**පිළිතුර:** ඔබ සේවය කරන අතර, එකිනෙකා සමඟ සුළු කාරණා වලට නොරොක් වන්නට එපා එනම්, සිත් පීඩා ඇති කර නොගන්න. ඔබ එකිනෙකා සමඟ ලුණු වතුර මෙන් වී, එකිනෙකා සමඟ කතා බස් නොකරන්නේ නම්, ඔබ අවැඩක් කිරීමට උපකරණ වෙයි. ඇතැම් දරුවන් පියා සමඟ පවා නොරොක් වී, වැරදි ක්‍රියා සිදු කිරීම ආරම්භ කරයි. එවිට, එවන් දරුවන්, දරුකමට හදාගැනීම, අවලංගු වෙයි.

ඕම් ශාන්ති. පිවිතුරු වන දරුවන්ට, පාරිශුද්ධකරු පියා, මෙහි අසුන්ගෙන විස්තර කරයි. පාරිශුද්ධකරු පියාට අඬ ගසන්නේ, අපවිත්‍ර දරුවන් පමණයි. නාටක සැලසුමද පවසන්නේ මෙය රාවණගේ රාජධානිය බැවින්, සියලුම මනුෂ්‍යයන් අපවිත්‍රයි. අපවිත්‍ර ජීව වන්නේ රාගයේ ගැලෙන අයයි. රාගයේ නොගැලෙන බොහෝ මනුෂ්‍යයන් සිටියි ඔවුන් බඹසර රකියි. පූජකයන්, මුල්ලාවරුන් සහ බෞද්ධයින් වැනි මිනිසුන් සිතන්නේ, ඔවුන් පාපයෙන් තොර බවයි ඔවුන් පිවිතුරුව රැඳී සිටියි. ඔවුන්ව පිවිතුරු කළේ කවුරුන්ද? ඔවුන් එසේ වූයේ තමන් විසින්මය. පිවිතුරුව රැඳෙමින්, රාගයේ නොගැලී සිටින, තව බොහෝ ආගම් තිබෙයි, නමුත් ඔවුන්ව පිවිතුරු කරනු ලබන්නේ, පාරිශුද්ධකරු පියා විසින් නොවෙයි. ඔවුන්ට පිවිතුරු ලෝකයේ අධිපතියන් විය නොහැක්කේ මේ නිසාය ඔවුන්ට පිවිතුරු ලෝකයට යාමටවත් නොහැක. සන්‍යාසීන්ද පාපයන් පහ අත්හරින නමුත් ඔවුන්ට අත්හැරීම ඉගැන්වූයේ කවුද? පාරිශුද්ධකරු, පාරිශුද්ධකරු පියා, පරමාත්ම ජීවය, ඔවුන් ලවා කිසි දෙයක් අත්හැරීමට සැලැස්වූයේ නැත. පාරිශුද්ධකරු පියා නොමැතිව, සාර්ථකත්වයක් තිබිය නොහැක. ඔවුන්ට පිවිතුරු ලෝකයට, සාම දේශයට යාමට නොහැක. පරමාත්ම පියා මෙහි පැමිණ, ඔබව පිවිතුරු කිරීම සඳහා ඔබට ශ්‍රීමත් ලබා දෙයි. ස්වර්ණමය යුගයට, පාපයෙන් තොර ලෝකය යැයි කියයි. එබැවින් ස්වර්ණමය යුගයට යන අය නිසැකයෙන්ම පිවිතුරු බව මින් ඔප්පු වෙයි ස්වර්ණමය යුගයේ සිටින්නේ පිවිතුරු ජීවයි. සාම දේශයේ වුවත් ජීවාත්ම පිවිතුරුයි මෙම රාවණගේ රාජධානියේ පමණයි, සෑම කෙනෙක්ම අපවිත්‍ර වන්නේ. සෑම කෙනෙක්ම පුනර්භව ගත යුතුයි. ස්වර්ණමය යුගයේ ජීවාත්මද පුනර්භව ගත යුතු නමුත්, ඔවුන් පුනර්භව ගන්නේ රාගය තුළින් නොවෙයි. එය සම්පූර්ණයෙන්ම පාපයෙන් තොර ලෝකයයි. රිදී යුගයේ අංශක දෙකක් අඩු වුවද, එයට දූෂිත යැයි නොකියයි. ඔවුන් පවසන්නේ ශ්‍රී රාමා දෙවියන් සහ ශ්‍රී සීතා දේවතාවිය කියාය. එය පළමුව දිව්‍යමය කලා 16ක් වන අතර ඉන්පසුව කලා 14ක් වෙයි. චන්ද්‍රයාටද එසේමයි. මින් ඔප්පු වන්නේ, පාරිශුද්ධකරු පියා පැමිණ, ඔබව පිවිතුරු කරන තුරු, කිසිම කෙනෙකුට විමුක්තිය හෝ ජීවන මුක්තියට යාමට නොහැකි බවයි. මාර්ගෝපදේශකයා වන්නේ පරමාත්ම පියා පමණයි. මේ ලෝකයේ පිවිතුරුව සිටින අය බොහොමයි. මිනිසුන් සන්‍යාසීන්ව විශ්වාස කරන්නේ ඔවුන්ගේ පිවිතුරු බව නිසාය. කෙසේවෙතත්, ඔවුන් පියාගේ මාර්ගයෙන් පිවිතුරු වන්නේ නැත. අශාරීරික පරම පියා, පරමාත්ම ජීවය, ඔබව පාරිශුද්ධත්වයට පත් කරන බව, ඔය දරුවන් දැන් දන්නවා. ඒ මිනිසුන් ඔවුන්ගේම මත වලට අනුව පිවිතුරු වන අතර ඔබ පිවිතුරු වන්නේ පියා මගිනි. ඔබට පිවිතුරු ලෝකයේ උරුමය හිමි වන්නේ පාරිශුද්ධකරු පියාගෙනි. එබැවින් පියා පවසන්නේ අහෝ දරුවනි, ඔබගේ විශාලතම සතුරා වන්නේ රාගයයි. එය ජය ගන්න! සෑම කෙනෙක්ම වැටෙන්නේ මෙය නිසාය. ඔවුන් කිසි විටෙක මෙසේ නොලියයි, 'මා කෝප වී මගේ මුහුණේ දැලි ගා ගත්තා.' ඔවුන් මෙසේ ලියන්නේ රාගය නිසාය, 'මා ඇද වැටී මගේ මුහුණේ දැලි ගා ගත්තා.' මෙම දේවල් පිළිබඳව දන්නේ ඔය දරුවන් පමණයි. ලෝකයා එය නොදනී. නාටකයට අනුව, බ්‍රහ්මණයන් වීමට ඇති අය, දිගින් දිගටම පැමිණෙයි. වෙනත් ආධ්‍යාත්මික හමුවීම් වල අරමුණක් හෝ ඉලක්කයක් නැත. ශිවානන්ද ආදීන්ට බොහෝ අනුගාමිකයන් සිටින නමුත්, ඔවුන් අතරින්ද අත්හැරීම අනුගමනය කරන්නේ ටික දෙනෙකි. ගෘහවාසීන් අත්හැරීම අනුගමනය නොකරයි. තම නිවෙස් සහ පවුල් අත්හරින්නේ ටික දෙනෙක් පමණයි. ඔවුන් සන්‍යාසීන් වන නමුත්, ඔවුන් පුනර්භව ගත යුතුයි. ඔහු ආලෝකයට මුසු වූ බව, ශිවානන්ද ගැන ඔබ නොකියයි. සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා පරමාත්ම පියා බව, ඔබට වැටහෙයි. ඔහු මාර්ගෝපදේශකයාද වෙයි. මාර්ගෝපදේශකයා නොමැතිව, කිසිම කෙනෙකුට ආපසු නිවසට යාමට

නොහැක. ඔබගේ පියා, පියා මෙන්ම ඥානයෙන් සපිරි කෙනා සහ මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ බීජය බවත් ඔය දරුවන් දන්නවා. මනුෂ්‍ය ලෝකයේ ආරම්භය, මැද සහ අවසානය පිළිබඳ ඥානය තිබෙන්නේ බීජය තුළ පමණයි. සෑම කෙනෙක්ම පියා ගැන කතා කරයි. පරමාත්ම දෙවියන්, ඔබගේ පරමාත්ම පියා, වන්නේ එක්කෙනෙක් පමණක් බව, ඔය දරුවන් දන්නවා, එබැවින් එම පියා තුළ සෑම කෙනෙක් වෙනුවෙන්ම දයාව තිබේ. මනුෂ්‍යයන් බොහෝ සිටියි. කෘමීන් ආදීන්ද බොහෝ සිටියි. එහි මනුෂ්‍යයන් සිටින්නේ ටික දෙනෙක් බැවින්, සෑම අන්දමක සත්ව වර්ගද අඩුවෙන් සිටියි. ස්වර්ණමය යුගයේ කිසිම අපද්‍රව්‍යයක් නැත. මෙහි, දිගින් දිගටම ඉස්මතු වන බොහෝ රෝග වර්ග තිබෙන අතර, ඔවුන් අඛණ්ඩව ඒවාට නව ඖෂධ නිපදවයි. නාටක සැලසුමට අනුව, ඔවුන් බොහෝ විවිධ මාදිලියේ කුසලතා අත්පත් කරගනී. ඒ සියලුම කුසලතා අයත් වන්නේ මනුෂ්‍යයන්ට වන නමුත් මෙම ලෝකයට එපිටින් සිටින පියාගේ කුසලතාවය කුමක්ද? පියාට මෙසේ කියයි, 'අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ ජීවාත්ම වන අපව පිවිතුරු කරන්න!' ඔවුන් පිවිතුරු සිරුර ගැන කතා කරයි. ඔවුන් ඒකායන කෙනාට පමණයි පාරිශුද්ධකරු, දුක නැති කර සතුට පිරිනමන්නා, යැයි කියන්නේ. සෑම කෙනෙක්ම නිසැකයෙන්ම ඔහුව තමන්ගේම භාෂාවෙන් සිහිකරයි. කෙනෙක් මිය යාමට ආසන්න වන විට, ඔහුට දෙවියන් සිහි වෙයි. වෙනත් කිසිම කෙනෙක් ඔහුට ආධාරයක් නොදෙන බව ඔහු විශ්වාස කරයි, ඔහුට දෙවි පියාණන්ව සිහි කරන්නට යැයි කියන්නේ මේ නිසාය. ක්‍රිස්තියානුවන්ද පවසන්නේ 'දෙවි පියාණන් සිහි කරන්න'. ඔවුන් 'ක්‍රිස්තු තුමා සිහි කරන්න' යැයි නොකියයි. දෙවියන්, ක්‍රිස්තු තුමාට වඩා උසස් බව ඔවුන් දන්නවා. සියල්ලන්ගේම දෙවියන් එක්කෙනෙක් වෙයි. මරණීය දේශය කුමක්ද, අමරණීය දේශය කුමක්ද කියා ඔය දරුවන් දැන් දන්නවා. ලොවෙහි වෙනත් කිසිවෙකු මෙය නොදනී. දිව්‍ය ලෝකය සහ අපාය යන දෙකම, මෙහි පවතින බව, ඔවුන් පවසයි. ස්වර්ණමය යුගය සහ දේවතාවන්ගේ රාජධානිය පැවති බව, ඇතැම් අය සිතයි. ඔවුන් වෙනුවෙන් දැන් වුවද, බොහෝ නව දේවාල දිගින් දිගටම තැනෙයි. අපව පාරිශුද්ධ කර, ආපසු අපගේ නිවහනට රැගෙන යාමට හැක්කේ, එක් පියා හැර, වෙනත් කිසිවෙකුට නොවන බව, ඔය දරුවන් දැන් දන්නවා. ඔබගේ බුද්ධිය තුළ තිබෙන්නේ අප අපගේ මිහිරි නිවසට යනවා. පරම පියා අපව ආපසු නිවසට රැගෙන යාමට සුදුසු කරවනවා. මෙය ඔබගේ අවධානයේ තිබිය යුතුයි. පියා විස්තර කරන්නේ ඔය දරුවන් මෙපමණ උපත් සංඛ්‍යාවක් ගෙන තිබේ. දැන්, පැමිණ, ශුද්‍රයන්ගෙන් අප බ්‍රාහ්මණයන් වී ඇති අතර, ඉන්පසුව බ්‍රාහ්මණයන්ගෙන් අප දේවතාවන් වෙයි. අප දෙව්ලොව යා යුතුයි. එය දැන් සංගම යුගයයි. බහුරූපී ප්‍රතිමාවේ, මුදුන් ගැටය වන බ්‍රාහ්මණයන් ඉතා සුප්‍රසිද්ධයි. හින්දූන්ටද මුදුන් ගැටයේ සංකේතය තිබේ. මනුෂ්‍යයන්, මනුෂ්‍යයන්ය. කල්සේවරු (සික්වරු) සහ මුස්ලිම්වරු ආදීන්ට සමාන මුහුණුවර තිබෙන බැවින්, ඔවුන්ව වෙන් කර හඳුනාගැනීමට නොහැකිය, නමුත් චීන සහ අප්‍රිකානුවන් වැනි සමහර ජාතීන්, ඔවුන්ගේ මුහුණුවරින් වෙන් කර හඳුනාගත හැක. ක්‍රිස්තියානුවන්ට භාරතය සමඟ සම්බන්ධයක් තිබේ, එබැවින් ඔවුන්, ඔවුන්ගෙන් ඉගෙන ගෙන තිබේ. ආගම් වල බොහෝ විවිධත්වයක් තිබේ. ඔවුන්ගේ චාරිත්‍ර වාරිත්‍ර සහ ඇඳුම් අඳින ආකාරය බොහෝ වෙනස්ය. ඔය දරුවන්ට දැන් ඥානය ලැබී තිබේ. අපි ස්වර්ණමය යුගය ස්ථාපිත කරනවා. එහි ආගමක් නොවීය. දැන් සියලුම විවිධ ආගම් මෙහි පෙනී සිටියි. දැන් අවසානයේදී වෙන කුමන ආගමද ස්ථාපිත වන්නේ? ඔව්, නව ජීවාත්ම පිවිතුරු බැවින්, එවන් ජීවාත්මයන්ගේ ප්‍රශංසාව යම් තරමකට තිබේ. යටි සිත පවසන්නේ, අවසානයේදී පැමිණෙන අයට නිසැකයෙන්ම, පළමුව සතුට සහ ප්‍රශංසාව ලැබී ඉන්පසුව දුක් අත්විඳින බවයි. ඔවුන්ට තිබෙන්නේ එක් උපතක් පමණයි. ඔබ සතුටු දේශයේ දීර්ඝ කාලයක් සිටින ආකාරයෙන්ම ඔවුන් සාම දේශයේ දීර්ඝ කාලයක් සිටියි. අවසානය දක්වා, අඛණ්ඩව බොහෝ වර්ධනයක් සිදුවෙයි. ගස ඉතා විශාලයි. මෙකල මනුෂ්‍ය ජනගහනය බොහෝ සේ වැඩී ඇත. ජනගහණය පාලනය කිරීමට ඔවුන් ක්‍රම සොයන්න උත්සාහ දරන්නේ මේ නිසාය. කෙසේවෙතත්, එමඟින් කිසිවක් ඉටුකර ගැනීමට නොහැකි වෙයි. නාටකයේ සැලසුමට අනුව, ජනගහණය වැඩි විය යුතු බව, ඔබ දන්නවා. නව පත්‍ර අඛණ්ඩව පැමිණෙන අතර ඉන්පසුව අතු රිකිලි දිගින් දිගටම මතුවෙයි. බොහෝ විවිධත්වයක් තිබේ. ඔබට වෙනත් කිසිම සම්බන්ධයක් නොමැති බව, ඔය දරුවන් දන්නවා. ඔබව පාරිශුද්ධත්වයට පත් කර, ලෝකයේ මුල, මැද සහ අවසානය ගැන පුවත් පවසන්නේ පරමාත්ම පියා පමණයි. ඔබද ඔහුට කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ අපව පිවිතුරු කරන්න. එබැවින් අපවිත්‍ර ලෝකය නියත වශයෙන්ම විනාශ වෙයි. මෙම ගිණුම තිබේ. ස්වර්ණමය යුගයේ සිටින්නේ ඉතා සුළු මනුෂ්‍ය සංඛ්‍යාවක් වන අතර කලි යුගයේ විශාල ජනතාවක් සිටියි. පරම පියා ඔබට උගන්වන බව, ඔය දරුවන් විස්තර කළ යුතුයි. මෙම පැරණි ලෝකය දැන් විනාශ වීමට තිබේ. ස්ථාපනය සිදුකරන්නේ පියාම පමණයි. පරමාත්ම දෙවියන් පවසයි මා ස්ථාපනය දිරිගන්වමි. විනාශය සිදුවන්නේ නාටකයට අනුවයි. භාරතයේ මෙම පිළිරූ තිබේ. බලන්න, මුඛයෙන් උපන් බ්‍රාහ්මණයන්, බ්‍රහ්මගේ නිර්මාණය, කොතරම් සිටිනවාද කියා? වෙනත් බ්‍රාහ්මණයන්

නිර්මාණය වන්නේ මව් කුසක් තුළිනි ඔවුන් පියාව පවා නොහඳුනයි. ඔබට දැන් උද්යෝගය ඇත. කලි යුගය විනාශ වීමට යන අතර ස්වර්ණමය යුගය පැමිණෙන බව, ඔබ දන්නවා. මෙය, අශ්වයා බිලි දෙන (රාජධානිය වෙනුවෙන්), රුද්‍රාගේ ඥානයේ යාගහෝමයයි. පැරණි ලෝකය, එය තුළට බිලි විය යුතුයි. කිරීමට, වෙනත් කිසිම කැප කිරීමක් නැත. පරම පියා පවසන්නේ ස්වාධිපත්‍යය වෙනුවෙන් අශ්වයා බිලි දෙන මෙම යාගහෝමය, මා නිර්මාණය කර තිබේ. එය මුළු ලෝකය පුරාම නිර්මාණය කර ඇත. මෙය යාග-කුණ්ඩයකි (යාගහෝම භාජනයක් මෙන්ම පූජනීය බව සැලකෙන, එය අවට ප්‍රදේශය). මුළු ලෝකයම එය තුළට බිලි වීමට තිබේ. මිනිසුන් යාග-කුණ්ඩ ඇති කරයි. මෙම මුළු ලෝකයම යාග-කුණ්ඩයකි. මෙම යාගකුණ්ඩයේ කුමක් සිදුවෙයිද? මෙහි සියලු දේම විනාශ වෙයි. මෙම භාජනය පිවිතුරු සහ අලුත් වෙයි. එවිට දේවතාවන් නැවතත් මෙහි පැමිණෙයි. වටේම සාගරය පවතින අතර මුළු ලෝකයම අලුත් වෙයි. බොහෝ කැලඹීම් තිබෙයි. කාටවත් අයත් නැති ස්ථානයක් නැත. සෑම කෙනෙක්ම පවසන්නේ 'මෙය මගේය.' 'මගේ, මගේ' යැයි කියන සියලුම මනුෂ්‍යයන් විනාශ වන අතර මුළු ලෝකයේම, මා පිවිතුරු කරන ටික දෙනා පමණක් ඉතිරි වෙයි. ප්‍රථමයෙන් ආදි සනාතන දෙවි දේවතා ධර්මය තිබෙයි. ඔවුන්ගේ රාජධානිය යමුණා ගඟ අසබඩ පිහිටා තිබෙයි. මේ සියලුම දේවල් ඔබගේ බුද්ධිය තුළ සනිටුහන් විය යුතු අතර ඔබට සතුටද තිබිය යුතුයි. මිනිසුන් අසුන්ගෙන, එකිනෙකාට කතා කියයි. මෙයත් සත්‍ය නාරායනගේ කතාපුවතයි එය අසීමිත කතාන්දරයකි. මෙම දේවල් දැන් ඔබගේ බුද්ධිය තුළ තිබේ. මෙයින්ද, ඉතා හොඳ සහ සේවයට ලැදි අයගේ බුද්ධියට මේවා ධාරණය කරගැනීමට හැකි වෙයි. ඔවුන්ගේ ඒප්‍රන පිරෙන අතර ඔවුන් අඛණ්ඩව දන් දෙනු ඇත. මෙවැනි කියමනක් තිබෙන්නේ මේ නිසාය දන් දීමෙන් ධනය අඩු වන්නේ නැත. දන් දීමෙන් එය වැඩි වන බව කියැවෙයි. ඔබගේ ධනය අවිනාශීය. දීමෙන්, ඔබගේ ධනය අවසන් වන්නේ නැත. ඔබ වැඩියෙන් දෙන තරමට, ඔබට වැඩි සතුටක් දැනෙයි. මෙම ඥානයට සවන් දෙන වෙලාවෙදී සමහර මිනිසුන් එකඟතාවය පළ කරමින් හිස වනයි. සමහරු උමුතු මිනිසුන් මෙන් ඔහේ අසුන්ගෙන සිටියි. පියා ඔබට ඉතා හොඳ කරුණු කියන බැවින් ඔහුට සවන් දෙන අතර, ඉබේටම ඔබගේ හිස වනමින් එකඟතාවය පළවෙයි. ඔය දරුවන් මෙහි, පියා ඉදිරියට පැමිණෙන්නේ නැවුම් වීම සඳහාය. පියා මෙහි අසුන්ගෙන බොහෝ උපක්‍රමශීලීව ඔබට කරුණු ලබා දෙයි. භාරතයේ දේවතාවන්ගේ රාජධානිය තිබුණු බව, ඔබ දන්නවා. භාරතයට දිව්‍ය ලෝකය යැයි කියයි. එය දැන් අපායයි. අපාය, දිව්‍ය ලෝකය බවට පරිවර්ථනය වී, අන් සියලු දෙනා විනාශ වී යයි. ඔබට දිව්‍ය ලෝකය, හෙට දිනයේ සිදුවන දෙයක් පිළිබඳ කාරණාවකි. ඊයේ, ඔබ පාලනය කරමින් සිටියා. වෙනත් කිසිවෙකුට මෙසේ කිව නොහැක. ක්‍රිස්තු තුමාට මෙපමණ වසර ගණනාවකට පෙර, පාරිදීසිය තිබූ බව, ඔවුන් පවසති. එකල, වෙනත් ආගමක් නොතිබුණි. අන් සියලුම ආගම් පැමිණෙන්නේ තඹ යුගයේ ආරම්භයට පසුවයි. මෙය වටහාගැනීමට ඉතා පහසු දෙයකි. කෙසේවෙතත්, ඔවුන්ට වටහා ගැනීමට හැකි වන සේ, මිනිසුන්ගේ බුද්ධි මේ දෙසට ඇදී යන්නේ නැත. ඔවුන් කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, එන්න! එබැවින් ඔහු නිසැකවම පැමිණ, අපවිත්‍ර අයව පිවිතුරු කරනු ඇත. කිසිවෙකුට මෙහිදි පිවිතුරු විය නොහැක. ස්වර්ණමය යුගයට පාපයෙන් තොර ලෝකය යැයි කියයි. එය දැන් දූෂිත ලෝකයයි. ප්‍රධානතම දෙය පාරිශුද්ධත්වයයි. මේ සඳහා ඔබ බොහෝ උත්සාහ දැරිය යුතුයි. මේ වන තෙක් සිදු වී ඇති සෑම දෙයක්ම, නාටකයට අනුව සිදු වී ඇතැයි පවසන බව ඔබ දන්නවා. කෙනෙකුට සිදු වූ දෙයක් හොඳ හෝ නරක බව, අපට කිව නොහැක. කුමක් සිදු වුවත් එය නාටකයේ නියම වී තිබේ. පියා ඔබට අනාගතය වෙනුවෙන් විස්තර කරදෙයි සේවයේදී අහවල් ක්‍රියා සිදු නොකරන්න. එසේ නැත්නම් අවැඩක් සිදුවෙයි. ඔබ එකිනෙකා සමඟ ලුණු වතුර මෙන් වී ඇති බව පවසන්නේ පියා පමණයි. ඔබ එකිනෙකාව මුණ නොගැසී හෝ කතා නොකරන විට මෙන්ම ඔබගෙන් කෙනෙකුට යමක් පැවසූ විට, ඔබ සිත් පීඩා ඇති කරගන්නේ නම්, ඔබ ලුණු වතුර මෙන් වී ඇති බව ඔබට වැටහෙයි. ඔබට ශිව බාබාව පවා අමතක වෙයි! මේ නිසයි ඔබට පවසන්නේ සෑම විටෙකම ශිව බාබා සිහි කරන්න. පරම පියා ඔය දරුවන්ට අනතුරු අඟවයි. එවන් ක්‍රියා සිදු කිරීමෙන් ඔබ පහත් වෙයි. කෙසේවෙතත්, එය ඔබගේ භාග්‍යයේ නොමැති නම් ඔබට නොවැටහෙයි. ඔවුන්ගේ උරුමය ලබා දෙන ශිව බාබා සමඟ පවා, ඔවුන් නොරොක් වෙයි. ඔවුන් තම ගුරුවරයා සමඟ මෙන්ම ශිව බාබා සමඟද නොරොක් වී තව දුරටත් පංතියට නොපැමිණෙයි. ඔබ කිසිදා ශිව බාබා සමඟ නොරොක් නොවිය යුතුයි. ඔබ, ඔහුගේ මුරලිය ඉගෙන ගත යුතු අතර ඔහුව සිහි කළ යුතුද වෙයි. බාබා පවසන්නේ දරුවනි, තමන් ජීවාත්මයක් බව සලකා මා සිහි කරන්න, එවිට ඔබට විමුක්තිය ලැබෙයි. ශරීර අවධානයට පත්වීමෙන් ඔබ ශාරීරික ජීව සමඟ නොරොක් වෙයි. ඔබට උරුමය ලැබෙන්නේ සීයාගෙන්ය. ඔබ පියාට අයත් වූ විට පමණයි, සීයාගේ උරුමය ලබා ගැනීමට හැකි වන්නේ. ඔබ පියාව දික්කසාද කළොත්, උරුමයක් ලබා ගන්නේ කෙසේද? ඔබ බ්‍රහ්මින් වංශය අතහැර, ශුද්‍ර වංශයට අයත් වන විට, උරුමය ඔබට අවසන් වෙයි. දරුකමට

හදාගැනීම එවිට අවලංගු වෙයි. එවිට පවා ඔබගෙන් ඈතමෙකුට වැටහෙන්නේ නැත. මායා කෙබඳුද යත්, ඇය ඔබව මුළුමනින්ම උමතු කරවයි. ඔබ බොහෝ සෙනෙහසින් පියා සිහි කළ යුතු නමුත්, ඔබ ඔහුව සිහි නොකරයි. මම ශිව බාබාගේ දරුවෙක් වන අතර ඔහු මාව ලෝක පාලකයෙක් බවට පත් කරවනවා! ඔහු අනිවාර්යෙන් භාරතයේ උපත ලබනවා. මිනිසුන් ශිවාගේ උපන් දිනය සමරති. ලෝක ඉතිහාසය සහ භූගෝලය නැවත නැවතත් ඒ අයුරින්ම සිදුවෙයි. එබැවින් ප්‍රථමයෙන් ශිව බාබා පැමිණ, දිව්‍ය ලෝකය නිර්මාණය කළ යුතුයි. ඔබට දිව්‍ය ලෝකයේ ආධිපත්‍යය ලැබෙන බව, ඔබ දන්නවා. පැමිණ, ඔබව දිව්‍ය ලෝකයේ වැසියන් බවට පත් කරවන්නේ, පරමාත්ම පියා පමණයි. ඔහු නව ලෝකය වෙනුවෙන් ඔබට රාජයෝගාව උගන්වයි. ඔබ ගොස්, නව ලෝකයේ පාලනය කරයි. අච්ඡා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. අවිනාශී ඥානයේ මිණි මුතු වලින් ඔබගේ ඡ්ප්‍රන පුරවා, ඒවා දන් දෙන්න. ඔබගේ සතුට රැඳී පවතින්නේ සහ ඔබගේ ඥානයේ ධනය අඛණ්ඩව වැඩිවෙන්නේ, ඥානය දන් දීමෙන් පමණයි.
2. කිසි විටෙක එකිනෙකා සමඟ සිත් පීඩා ඇති කර හෝ ලුණු වතුර මෙන් නොවන්න. පියා සිහිපත් කර, බොහෝ සෙනෙහසින් මුරලියට සවන් දෙන්න. උන්මත්තකයෙක් මෙන් නොවන්න.

**වරදානය:** ඔබ පරම පියා සමඟ යෝගාවේ සිට සැමගේම සහයෝගය ලබා ගන්නා සැබෑ යෝගියෙකු සහ සහයෝගී ජීවාත්මයක් වේවා.
යමෙකු යම් ප්‍රමාණයකට යෝගියෙකු වන්නේද, ඒ අනුව ඔහුට අනිවාර්යෙන්ම සැමගේම සහයෝගය ලැබේ. යෝගියෙකුගේ සම්බන්ධතාවය - එනම්, ඔහුගේ සෙනහස - 'බීජය'(පරමාත්මය) සමඟ පවතින බැවින්, එම සෙනෙහසට ප්‍රතිඋපකාරයක් ලෙස ඔහුට සැමගේම සහයෝගය ලැබේ. බීජය සමඟ යෝගාව පවත්වන සහ සෙනහසින් බීජයට ජලය සපයන අය, සියලු ජීවාත්මයන්ගෙන් සහයෝගය නම් වූ ඵලය ලබා ගනී. බීජය සමඟ යෝගාව පැවතීම නිසා, ඔවුන්ට සමස්ත වෘක්ෂය සමඟම සම්බන්ධතාවයක් ඇති වේ.

**පාඨය:** පැරණි සංස්කාර ගැන "මගේ" යැයි පැවසීම යනු ඔබේ උත්සාහයන් මන්දගාමී වීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් ඔබගේ දානපති ස්වරූපය හෙළිදරව් කරන්න.**

යමෙකුට ඕනෑම ආකාරයක සහයෝගයක් අවශ්‍ය වූ විට, 'දානපතියාගේ' දරුවෙකු ලෙස ඔබ එම පුද්ගලයාට සහයෝගය ලබා දෙන්න. කෙසේවෙතත්, ඔබට සැමදෙනා සමඟම සහයෝගයෙන් කටයුතු කළ හැක්කේ ඔබ සියල්ලන් කෙරෙහිම සෙනෙහෙවන්තයකු වූ විට පමණි. ඔබ සෙනෙහෙවන්තයකු නොවන්නේ නම්, ඔබට සැම දෙනා සමඟම සහයෝගයෙන් කටයුතු කළ නොහැක. මේ නිසාම, ඔබ ඔබේ සිතිවිලි, වචන, ක්‍රියා සහ සබඳතා තුළ සහයෝගීව කටයුතු කරමින් සාර්ථකත්වයේ මූර්තියක් විය යුතුය.